මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලනයට එරෙහිව මහ පාරට බැස සටන් කිරීමටත්, ඒ සඳහා වහාම සංවිධානය වීමටත් එක්සත් ජාතික පක්ෂයේ සියලු පාර්ශ්වයන් එකට ඒකරාශී වී තීරණය කළේ යැයි විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ 'සිරිකොත' පක්ෂ මූලස්ථානයේ දී ඊයේ (19) පැවැති විශේෂ ප්‍රවෘත්ති සාකච්ඡාවේදී පැවසීය.

කවුරුන්, කෙසේ බලාපොරොත්තු වුවත් එක්සත් ජාතික පක්ෂයේ කවුරුවත් ගහගත්තේ වත්, මරා ගත්තේ වත්, කෑ ගැසුවේ වත් නැතැයි ද ඒ වෙනුවට සිදුවූයේ ආණ්ඩුවට එරෙහිව එකට ඒකරාශී වීම යැයි ද පෙන්වා දුන් රනිල් වික්‍රමසිංහ මහතා පක්ෂයේ ප්‍රධාන නිල සඳහා එකඟතාවයෙන් පුද්ගලයින් තෝරා පත් කර ගැනීමේ ක්‍රමයට ප්‍රමුඛස්ථානය දිය යුතු බවට ද සියලු පාර්ශ්වයන් තීන්දු කළේ යැයි ද අවධාරණය කළේය.

එක්සත් ජාතික පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩල තීරණ දැනුම්දීම සඳහා 'සිරිකොත' පක්ෂ මූලස්ථානයේ පැවැති මේ ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී වැඩිදුරටත් අදහස් දැක්වූ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා මෙසේද කීය.

කවුරුන් බලාපොරොත්තු වුණත් එක්සත් ජාතික පක්ෂයේ අප කවුරුවත් ගහගත්තේ වත්, මරා ගත්තේ වත්, කෑ ගැසුවේ වත් නැහැ. අප සියලු පාර්ශ්වයන් එකට ඒකරාශී වී එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ දී සියලු තත්ත්වයන් සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කළා.

එකට ඒකරාශී වී පුළුල් ලෙසත්, දීර්ඝ ලෙසත් සාකච්ඡා කළ අප මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලනයට එරෙහිව මහ පාරට බැස සටන් කිරීමටත්, ඒ සඳහා විධිමත්ව සංවිධානගත වීමටත් තීරණය කළා.

එක්සත් ජාතික පක්ෂ ප්‍රති සංවිධානය සම්බන්ධයෙන් සය පුද්ගල ප්‍රතිසංවිධාන කමිටුව මඟින් ඉදිරිපත් කෙරුණු වාර්තාව අප පිළිගත්තා. කෙසේ නමුත් විනය, කාන්තාවන්ට එක්සත් ජාතික පක්ෂයේ ලබාදෙන ඉඩ ප්‍රස්ථා, සාමාජික අයිතිවාසිකම් සහ සියලුම

ශාඛා සමිති සම්බන්ධයෙන් ද තවදුරටත් සාකච්ඡා කරමින් තීන්දු තීරණවලට පැමිණීමට නියමිතව තිබෙනවා.

මේ කරුණු කාරණා සම්බන්ධයෙන් පළාත් සභා සහ පළාත් පාලන මන්ත්‍රීවරුන් සමඟ ද තවදුරටත් කරුණු සාකච්ඡා කිරීමේ වගකීම ජෝශප් මයිකල් පෙරේරා මහතාගේ සභාපතිත්වයෙන් යුතු සය පුද්ගල කමිටුව ද, සභාපති ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතාට ද පැවරුවා.

ඒ සියලු පාර්ශ්වයන්ගේ අදහස් සහ යෝජනා සියල්ල ඊළඟ කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට අප කටයුතු කරනවා.

එක්සත් ජාතික පක්ෂ ප්‍රතිසංවිධානය සම්බන්ධයෙන් සය පුද්ගල ප්‍රති සංවිධාන කමිටුව මඟින් ඉදිරිපත් කෙරුණු වාර්තාව මූලික වශයෙන් පිළිගත් අප පක්ෂයේ ප්‍රධාන නිලධාරීන් ඒකමතිකව තෝරා ගැනීමේ ක්‍රමයට ප්‍රමුඛස්ථානය ලබාදීමට තීරණය කළා.

එමෙන්ම එක්සත් ජාතික පක්ෂයට අලුත් ව්‍යවස්ථාවක් සකස් කිරීමට ද තීරණය කළ අප ඉදිරියේ දී රැස්වී ඒ ගැන ද සාකච්ඡා කිරීමට එකඟ වුණා.

***එහිදී අදහස් දැක්වූ එක්සත් ජාතික පක්ෂ සය පුද්ගල ප්‍රතිසංවිධාන කමිටුවේ සභාපති ජෝශප් මයිකල් පෙරේරා මහතා***

එක්සත් ජාතික පක්ෂ ප්‍රතිසංවිධානය සම්බන්ධයෙන් පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය ඓතිහාසික තීන්දුවක් ගත්තා.

එක්සත් ජාතික පක්ෂයේ නායකයින් සමඟ විවිධ අවස්ථාවන්හි දී ප්‍රශ්න ඇති වූ අවස්ථාවේ දී ඒ සෑම අවස්ථාවකදීම ගත් තීරණ පිළිබඳව අපේ නායක රනිල් වික්‍රමසිංහ මහතාටත්, මටත් හොඳ මතකයක් තිබෙනවා.

එක්සත් ජාතික පක්ෂයේ නායකයා සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති වූ සෑම අවස්ථාවකදීම ඒ ප්‍රශ්න පක්ෂයේ ජයග්‍රහණයට හේතු වූ බව අපේ දේශපාලන ඉතිහාසය සාක්ෂි දරනවා.

එබඳු ප්‍රශ්න ඇති වූ සෑම අවස්ථාවකදීම ඒ පිළිබඳ සාකච්ඡා කිරීමෙන් පසුව සියලු පාර්ශ්වයන් පොදු එකඟතාවක් යටතේ ඒ ප්‍රශ්න විසඳා ගෙන රටත් – ජනතාවත් ඉදිරියට ගියේ ඉතාම ජයග්‍රාහීවයි.

එක්සත් ජාතික පක්ෂ ප්‍රතිසංවිධානය සම්බන්ධයෙන් ඇති වූ තත්ත්වයේ දී මේ මොහොතේ ද එදා වගේම ඒ ශක්තිමත් අඩිතාලම දමා ගැනීමට අපට හැකි වුණා.

එක්සත් ජාතික පක්ෂයේ නායක, නියෝජ්‍ය නායක, උප නායක, සභාපති සහ ජාතික සංවිධායක යන තනතුරු සඳහා එකඟතාවෙන් පුද්ගලයින් තෝරා පත් කර ගැනීමට තීරණය කළ අප පක්ෂයේ දෙවන සහ තෙවන පෙළ ගොඩනැගීමට ද තීන්දු කළා.

ඒ අනුව මේ ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙළ තව තවත් ශක්තිමත් කරමින් ඉදිරියට ක්‍රියාත්මක කිරීමටත්, ජයග්‍රහණය ලබා ගැනීමටත් අප බලාපොරොත්තු වෙනවා.

ජේ.ආර්. ජයවර්ධන සහ ඩඩ්ලි සේනානායක යන නායකයින් අතර එදා ඇති වූ ප්‍රශ්නය අවසානයේ දී ඉතාම හොඳින් විසඳී අපට ජයග්‍රහණය කරා යන්න හැකි වුණා. එමෙන්ම රණසිංහ ප්‍රේමදාස මහතා සියලු දෙනාගේ එකඟතාවය ඇතිව ඉහළට පැමිණ රටේ නායකත්වයට ද පත් වුණා.

කෙසේ නමුත් දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාට එරෙහිව අපේම අය එකතු වී දෝශාභියෝගයක් ඉදිරිපත් කළා අපට මතකයි.

ආණ්ඩුවේ මර්දනයට එරෙහිවත්, ජනතා විරෝධී ක්‍රියාවන්ට එරෙහිවත් අප යන ගමන තවත් ශක්තිමත් වීම සඳහා මේ ඇති වූ නව එකමුතුභාවය සහ එක්සත් භාවය ශක්තියක් වේවා යැයි අප ප්‍රාර්ථනා කරනවා.